# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1965/16 - 2016 මැයි මස 03 වැනි අඟහරුවාදා - 2016.05.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට යාපනය - කිලිනොච්චිය ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය යටතේ වන්නාර්පන්නෙයි නැගෙනහිර මලාපවහන පොම්පාගාර අංක 23 ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2016 අප්‍රේල් මස 18 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1182

**උපලේඛනය**

යාපනය දිස්ත්‍රික්කයේ, නල්ලූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක J/105, කාන්තර්මඩම් දකුණ නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ වන්නාර්පන්නෙයි නැගෙනහිර ගමේ පිහිටි ආවරන්තුලකායි නමැති ඉඩමෙන් හෙක්ටයාර් 0.0328 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | පාර ; |
| *නැගෙනහිරට* | : | අපජල ඇල ; |
| *දකුණට* | : | ඒ. මදුරා මහතා හිමිකම් කියන ඉඩම ; |
| *බටහිරට* | : | ඒ. මදුරා මහතා හිමිකම් කියන ඉඩම සහ එස්. මාගේෂ්වරී හිමිකම් කියන ඉඩම. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : උදයකුමාර දේවජෝති,
අංක 8/1, කන්ධපුරාන වීදිය,
කන්ධර්මඩම්.

05 - 478


1A - G 23390 — 26 (2016/05)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට ඇහැලියගොඩ ජල සම්පාදන ක්‍රමයේ කාර්යලය, ගබඩාව හා ජල ටැංකිය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින් මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2016 අප්‍රේල් මස 18 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1178

**උපලේඛනය**

රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඇහැලියගොඩ වත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කොහිලදෙනිය ගමේ පිහිටි ඇහැලියගොඩ රජයේ වැවිල්ල නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් රූඩ් 03, පර්චස් 35 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

*උතුරට* : වතුපාර ;
*නැගෙනහිරට* : එම ඉඩමේ ඉතිරි කොටස ;
*දකුණට* : වතුපාර ;
*බටහිරට* : එම ඉඩමේ ඉතිරි කොටස.

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන් :*

01. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව,
වොක්සෝල් පටුමග,
කොළඹ 02.

02 පුස්සැල්ලාව වැවිලි සමාගම,
අංක 19,
ඩඩ්ලි සේනානායක මාවත,
කොළඹ 08.

05 - 479

---

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට ගොඩකවෙල ජල සම්පාදන ක්‍රමයේ බලවින්න බූස්ටර් පොම්පාගාරය ඉදිකිරීම සඳහා අතිරේක ඉඩම් කොටසක නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2016 අප්‍රේල් මස 18 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1174

**උපලේඛනය**

රත්නපුර දිස්ත්‍රික්කයේ, ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බලවින්න උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, මොරගහඅතුර ගමේ පිහිටි මීගහමඩයාය නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 03 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස ඃ

| | | |
|---|---|---|
| *උතුරට* | ඃ | මණ්ඩලයට අත්කර ගැනීමට යෝජනා කර ඇති ඩබ්. එම්. පොඩිඅප්පුහාමි මහතා හිමිකම් කියන ඉඩම ; |
| *නැගෙනහිරට* | ඃ | ප්‍රජා ශාලාව පාර ; |
| *දකුණට* | ඃ | බලවින්න සිට මොරගහ අතුරු පාර හා විදුලි ට්‍රාන්ස්පෝමරය ; |
| *බටහිරට* | ඃ | ඩී. කේ. යූ. සේනාරත්න මහතා හිමිකම් කියන ඉඩම. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* ඃ 01. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව,
හෙක්ටර් කොබ්බෑකඩුව මාවත,
කොළඹ 07.

05 - 480

---

**ශුද්ධි පත්‍රය**

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තිය අනුව නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යවරයා වන මා විසින් 2016.01.26 වැනි දිනැති අංක 1951/12 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* අංක 02 - 297 යටතේ පළ කරන ලද නිවේදනයේ උපලේඛනයෙහි ඉඩම් කොටසේ අංකය හා ප්‍රමාණය ප්‍රමාද දෝෂයකින් කැබලි අංක ඃ 7 හා පර්චස් 40 යනුවෙන් සඳහන් වුවත් එය, කැබලි අංක ඃ 8 හා පර්චස් 30 ක් ලෙස නිවැරදි විය යුතු බව 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය රවුෆ් හකීම් වන මම මෙයින් ප්‍රකාශයට පත් කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2016 අප්‍රේල් මස 18 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1160

05 - 481

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.